බාහිර (External)

# කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂිතාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය
# පුරප්පාඩු

කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂිතාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් **2025.08.11** දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. තනතුරු:- තාක්ෂණික නිලධාරී (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ -III ශ්‍රේණිය)

I. (අ) අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් ඕනෑම විෂය ධාරාවක් යටතේ එක් වරකදී විෂයන් තුනක් (03) සමත් වී තිබිය යුතුය.

සහ

(ආ) තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණය/තොරතුරු සන්නිවේදන තාක්ෂණය/ තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍ර හෝ ඊට සමාන ක්ෂේත්‍රයක ඒ සම්බන්ධයෙන් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හෝ පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හෝ පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තිය සුදුසුකම 05 වන මට්ටම ( NVQ Level 5) හෝ ඊට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබිය යුතුය.

**සටහන:** තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වයස** : අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 නොවැඩි විය යුතුය.
**වැටුප් ක්‍රමය** : U MT 1 (III) - Rs. 51,095-7x540;10x640-60,575 p.m (2025.01.01 දිනට)
**බඳවා ගැනීම:** ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 02. තනතුරු:- කාර්මික නිලධාරී (II ශ්‍රේණිය , 'ආ' ඛණ්ඩය) (පුහුණු වන)

**අවශ්‍ය සුදුසුකම්:**

01. (අ) අ.පො.ස. (උසස් පෙළ) විද්‍යා විෂයයන් 03 කින් එකම අවස්ථාවේදී සමත්ව තිබීම : විෂය සංකලනය/සංකලන අධ්‍යයනාංශයේ නිර්දේශය මත අදාළ පීඨය විසින් තීරණය කරන පරිදි වෙයි.

සහ

(ආ) අවම වශයෙන් වර්ෂයක පූර්ණකාලීන කාලසීමාවකින් යුත් හෝ ඊට සමාන තනතුරට අදාළ කුසලතා මූලික විධිමත් පුහුණුවීම් වැඩ සටහනකින් සමත්වීම. මෙම කාර්ය සඳහා කුසලතා මූලික විධිමත් පුහුණුවීමේ වැඩසටහන පිළිගැනීම නිශ්චය කරනු ලබන්නේ අදාළ පීඨය විසිනි.

**වයස** : අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට වයස අවුරුදු 45 ට නොඅඩු විය යුතුය.
**වැටුප් ක්‍රමය** : U MT 1 (III) - Rs. 51,095-7x540;10x640-60,575 p.m (2025.01.01 දිනට)
**බඳවා ගැනීම** : ප්‍රායෝගික පරීක්ෂණය සහ සම්මුඛ පරීක්ෂණය මගින්.

## 03. තනතුරු:- කළමනාකරණ සහකාර III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම්:**

1. අ.පො.ස.(සා.පෙළ) විභාගයේ
   - සිංහල භාෂාව/දෙමළ භාෂාව
   - ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
   - ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයක් එක් වරක දී සමත් වී තිබීම

සහ

2. අ.පො.ස. (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයන් සමත් වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර).

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

අ. පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිලිබඳ සුදුසුකම්

සහ

ආ. පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිලිබඳ වසර 02 ක පළපුරුද්ද

**සටහන :-**

(a) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(b) අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 නොවැඩි විය යුතුය.

(c) මනා චරිතවත් පුද්ගලයකු විය යුතුය.

**වැටුප් ක්‍රමය** : U MN 1 (III) - Rs. 49,475-17x540-58,655 p.m (2025.01.01 දිනට)

**බඳවා ගැනීම:** ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 04. තනතුරු:- පූර්ණකාලීන උපශාලාධිපති (II ශ්‍රේණිය) - කාන්තා

**අවශ්‍ය සුදුසුකම්:**

(I) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු විය යුතුය. නේවාසිකාගාර පරිපාලනය හා කළමනාකරණය පිළිබඳව පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වයස** : අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට වයස අවුරුදු 45 ට නොඅඩු විය යුතුය

**වැටුප් ක්‍රමය** : U MN 3 (II) Rs. 71,365 - 1,190 x 10 - 92,785 p.m (2025.01.01 දිනට)

**බඳවා ගැනීම** : සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 05. තනතුරු:- විදුලි කාර්මික (III ශ්‍රේණිය)

**අවශ්‍ය සුදුසුකම්:**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද, තනතුරේ රාජකාරිවලට අදාළව, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සටහන:-**

1) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

2) තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.

3) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**වයස** : අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය

**වැටුප් ක්‍රමය** : U-PL 3 (III) - Rs. 48,005- 16x490-55845 p.m (2025.01.01 දිනට)

**බඳවා ගැනීම** : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 06. තනතුරු: වැඩ සහායක (කොන්ත්‍රාත් පදනම)

**අවශ්‍ය සුදුසුකම්:**

අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබිය යුතුය.

**සටහන:-**

1) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2) තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
3) විශිෂ්ට සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුය.

**වයස** : අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
**වැටුප් කේතය**: U-PL 1 (III)
**වැටුප** : U-PL 1 (III) Rs. 55,567.00 (01.01.2025 දිනට ගෙවන මුදල) + Rs. 17,800 (ජීවන වියදම් දීමනාව)
**බඳවා ගැනීම** : වෘත්තීය පරීක්ෂණයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 07. විද්‍යාගාර සහායක (කොන්ත්‍රාත් පදනම)

**අවශ්‍ය සුදුසුකම්:**

1. අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් (06) සමත් වී තිබිය යුතුය. අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී සම්මාන දෙකක් (02) ලබා තිබිය යුතුය, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 2 හෝ 3 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය.

හෝ

2. අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් (06) සමත් වී තිබිය යුතුය. අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී සම්මාන දෙකක් (02) ක් ලබාගෙන තිබිය යුතුය. කාර්මික කුසලතා සහිත අදාළ ක්ෂේත්‍රයක වසරක (01) සේවා පළපුරුද්දක් තිබිය යුතුය.

**සටහන:-**

1) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2) තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
3) විශිෂ්ට සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුය.

**වයස** : අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
**වැටුප් කේතය** : U-PL 2 (III)
**වැටුප** : U-PL 2 (III) Rs. 57,456.00 (01.01.2025 දිනට ගෙවන මුදල) + Rs. 17,800 (ජීවන වියදම් දීමනාව)
**බඳවා ගැනීම** : වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**සේවා කොන්දේසි:**

01. මෙම තනතුරු ස්ථිර ය. පත්වීම් වසර තුනක (3) ක පරිවාස කාලයකට යටත් වේ (කොන්ත්‍රාත් තනතුරු හැර)
02. තෝරාගත් අපේක්ෂකයින් දැනට රාජ්‍ය දෙපාර්තමේන්තුවක සේවය කරන්නේ නම් ඔහුගේ / ඇයගේ නිදහස් කිරීම ලබා ගත යුත්තේ අදාළ පත්කිරීමේ අධිකාරිය හරහා ය. රජයේ සේවකයින්ට විශ්වවිද්‍යාල සේවයේ යෙදී සිටියදී විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් පවත්වා ගැනීමට සුදුසුකම් නොලබයි.

**ප්‍රතිලාභ:**

01. තෝරාගත් අයදුම්කරුවන් තම ඉපයීම්වලින් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක විය යුතු අතර විශ්වවිද්‍යාලය මගින් එකී ඉපයීම් වලින් 08% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලීය විශ්‍රාම වැටුපට ද 07% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලට බැර කරනු ඇත.
02. එයට අමතරව 03% ක මුදලක් විශ්වවිද්‍යාලය විසින් සේවක භාරකාර අරමුදලට ද බැර කරනු ඇත.
03. ඉහත වැටුපට අමතරව, රජයේ අනුමත දීමනා සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ජීවන වියදම් දීමනාව ද අදාළ කාර්ය මණ්ඩලයට ගෙවනු ලැබේ.

විශේෂ සටහනඃ කළමනාකරණ සේවා චක්‍රලේඛ 6/2025 අනුව වැටුප් ගෙවනු ලැබේ.

**අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය ඃ**

අයදුම්පත් කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ වෙබ් අඩවියෙන් (http://uciars.cmb.ac.lk ) බාගත කර ගත හැකිය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහ අදාල සහතිකවල ඡායා පිටපත් සමග **2025.08.11** දිනට හෝ ඊට පෙර "ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය, වැලිගත්ත, හම්බන්තොට" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහල වම් කෙලවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

විශ්වවිද්‍යාල සේවයේ/ රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල/ අයදුම්කරුවන් ස්වකීය ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් කර නැති හෝ අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අනෙකුත් නියමිත අවශ්‍යතාවයන් සපුරා නොමැති අයදුම්පත් කිසිදු හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කරන අතර, එවැනි අයදුම්පත් කිසිදු හේතුවක් නිසා යළි සලකා බලනු නොලැබේ.

අධ්‍යක්ෂ
කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය
වැලිගත්ත
හම්බන්තොට.
2025.07.20